කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
නීති පීඨය
නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර – 2022

අපරාධ නීතිය
(පැය තුනයි)

මුළු ප්‍රශ්න ගණන: 06

ප්‍රශ්න **තුනකට(03)** පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.)

---

1. විමල්ගේ 20 හැවිරිදි පුත්‍රයා වන චමල් මානසික ආබාධයකින් පෙළුණු නිසා විමල් චමල්ගෙන් නපුරු ආත්මය පලවා හැරීමට යකැදුරෙකු වන කරුණා ගුරුන්නාන්සේ හා ඔහුගේ සහායකයා වන පෙරුමාල් අයියර් තොවිල් ශාන්ති කර්මයක් සිදුකිරීමට කුලියට ගත්තේය. ශාන්ති කර්මය දිනයේ දී විමල් සහ ඔහුගේ මිතුරා වන ධරෙන් මත්පැන් පානය කළහ. චමල් ව මධ්‍යම රාත්‍රියේ ප්‍රදේශයේ සුසාන භූමිය වෙත ගෙන යන ලෙස කරුණා, පෙරුමාල්ට සහ විමල්ට උපදෙස් දුන්නේය. සුසාන භූමියේ දී ආවේශ තත්වයට පත්වූ කරුණා සහ පෙරුමාල් චමල්ට බරපතළ තුවාල සිදු කරමින් පහර දීමට පටන් ගත්තේය. මේ අතර සොහොන් කොතක් පිටුපස සැඟවී සිටිමින් රහසිගතව ශාන්තිකර්මය නැරඹීමට ධරෙන් සුසාන භූමියට පැමිණියේ ය. ධරෙන් අවතාරයක් යැයි වරදවා වටහා ගත් විමල්, ධරෙන් ට යකඩ පොල්ලකින් පහර දුන්නේය. සිදුවිය හැකි තවත් තුවාල වලින් තමාව බේරා ගැනීමට ධරෙන් විශාල ගලකින් විමල්ට පහර දුන්නේය. විමල් සහ ධරෙන් බරපතළ තුවාල ලබා දිවි ගලවා ගත් නමුත් චමල් රෝහලේදී මිය ගියේය.

   ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන හා අදාළ නඩු තීන්දු නීතිය කෙරේ අවධානය යොමු කරමින් කරුණා, පෙරුමාල්, විමල් සහ ධරෙන්ගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

2. වංකකම යනු දේපල සම්බන්ධ අපරාධ සියල්ලේම පාහේ හරය වන අතර, වංකකම නිර්වචනය කරනු ලබන්නේ ~~විෂය~~ මනෝමූලික පදනමින් (subjective terms) මිස ~~මනෝ~~ විෂයමූලික පදනමින් (objective term) නොවේ.

උක්ත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ දේපලට එරෙහි වැරදි හා අදාළ නඩු තීන්දු නීතිය කෙරේ අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

3. අයේෂ්, 14 හැවිරිදි පාසල් සිසුවියක වන විමලා සමඟ ප්‍රේම සම්බන්ධයක් පවත්වාගෙන යන අතර, එම යුවල ප්‍රදේශයේ උද්භිද උද්‍යානයක කාලය ගත කිරීමට පුරුදුව සිටියහ. එක් දිනක් අයේෂ්, විමලාට සිය නිවසට ආරාධනා කළ අතර, ඇයගේ දෙමව්පියන්ට දැනුම්දීමකින් තොරව විමලා තනිවම අයේෂ් ගේ නිවසට ගියා ය. විමලා අයේෂ් ගේ නිවෙසට ඇතුළු වූ පසු ඔහු දොර අගුළු දමා විමලාව කාමරයකට රැගෙන ගිය අතර, එහිදී ඇයට අයේෂ්ගේ මිතුරන් හතර දෙනෙකු හමු විය. අයේෂ් විමලාට මත්පැන් ස්වල්පයක් පිළිගැන්වූ අතර ඇය එය ප්‍රතික්ෂේප කලාය. පසුව අයේෂ්, ඔහුගේ මිතුරන්ගේ සහයෙන් විමලා ගේ අත්පා ලණුවකින් බැඳ, රෙදි කඩකින් ඇගේ මුව සිර කළේය. දින දෙකකට පසුව විමලා සිහිසුන්ව අසල මුඩුක්කු ප්‍රදේශයක දී සොයා ගන්නා ලදී. වෛද්‍ය වාර්තාවෙන් බරපතල තුවාල කිහිපයක් අනාවරණය විය; යකඩ පොල්ලක් මගින් සිදුවිය හැකි දරුණු හිසේ තුවාලයක්, වම් ඇසේ පෙනීම ස්ථිර ලෙස නැති වීම, දෙපා වල සහ මුහුණේ තුවාල දහසයක්. තවද, විමලා ව පුද්ගලයන් පස් දෙනෙකු විසින් දූෂණය කර ඇති බවද එම වාර්තාවෙන්ම අනාවරණය විය.

ව්‍යවස්ථාපිත විධිවිධාන සහ අදාළ නඩු තීන්දු නීතිය උපුටා දක්වමින් අයේෂ් සහ ඔහුගේ මිතුරන් සිව් දෙනාගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

4. යථාර්ථ වගකීමේ වරදක් නිර්මාණය කිරීමේ විශේෂිත අරමුණු ඇති අතර, මෙය සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ වරදක මානසික අංගය මගහැරීමෙනි. එහෙත්, යථාර්ථ වගකීම පිළිබඳ මූලධර්මයේ යෙදීම විවිධ අධිකරණ පද්ධතීන් තුළ වෙනස් වේ.

උක්ත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? ශ්‍රී ලංකාවේ සහ එක්සත් රාජධානියේ අදාළ ව්‍යවස්ථා සහ නඩු තීන්දු නීතියේ උදාහරණ ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

5. **(අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු ලියන්න.**

(අ). ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 490 වගන්තියේ නොකළහැකි අපරාධයක් සිදු කිරීමට තැත් කිරීම පිළිබඳව සඳහනක් නොමැත. 490 වගන්තියේ නිදර්ශන දෙකම අර්ථ විග්‍රහ කර ඇත්තේ සාපරාධී තැත් කිරීම යන වරදේ සාවද්‍ය ක්‍රියාව සඳහා වන හුදු උදාහරණ ලෙස ය. නමුත් නොකළහැකි තැත් කිරීම් වල (impossible attempt) අංගයන් සම්බන්ධයෙන් එම වගන්තිය හෝ නිදර්ශන ස්වයං පැහැදිලි කිරීමක් නොකරයි. එම නිසා, නොකළහැකි තැත්කිරීම් වල අදාළත්වය ශ්‍රී ලංකාව තුළ ප්‍රහේලිකාවක් ලෙස ඉතිරිව පවතී.

ශ්‍රී ලංකාවේ නීතිය තවත් නීති පද්ධතියක් හා සංසන්දනය කරමින් උක්ත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ආ). දණ්ඩ නීති සංග්‍රහයට අනුව, අනුබල දීම විවිධ ආකාරයන් වලින් සිදු විය හැක. අධිකරණ විසින් මෙම ආකාර අධිකරණමය අර්ථ නිරූපණයන් හරහා පුළුල් කර ඇති අතර, ඒ සමගම එහි ප්‍රායෝගික පැතිකඩ ඉස්මතුකර ඇත.

අදාළ දණ්ඩ නීති සංග්‍රහ ප්‍රතිපාදන, පැහැදිලි කිරීම් සහ නඩු තීන්දු නීතිය ආශ්‍රයෙන් උක්ත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

6. ප්‍රියා සහ කුමාර මිතුරන් හඳුනා ගන්නා වෙබ් පිටුවක් (dating site) හරහා හමුවෙන අතර, ඔහුට සුදුසු රැකියාවක් හමු වූ වහාම ප්‍රියාව විවාහ කරගන්නා බවට කුමාර පොරොන්දු වූ නිසා ඔවුන් එකම නිවසේ ජීවත් වීමට (living together) පටන් ගත්හ. කුමාර ප්‍රියා සමඟ විවාහ වීමට හෝ රැකියාවක් සොයා ගැනීමට උනන්දුවක් නොදැක් වූ නිසා මාස කිහිපයකට පසුව මෙම යුවල දබර කිරීමට පටන් ගත්හ. මිතුරන් හඳුනා ගන්නා වෙබ් පිටුවක් හරහා හමු වූ රුවන් සමඟ ප්‍රියාට සම්බන්ධතාවක් පවතින බව කුමාර පසුව දැනගත් අතර, මේ නිසා ප්‍රියා සහ කුමාර අතර වූ ගැටුම් තවත් දුරදිග ගොස් ඇත. එක් දිනක් ප්‍රියා කුමාරට කෙටි පණිවිඩයක් යවමින් කියා සිටියේ තමන් රුවන් සමග රාත්‍රිය ගත කරන බැවින් ඇයට නිවසට පැමිණිය නොහැකි බවයි. පසුදින ප්‍රියා නිවසට පැමිණි විට මෙම යුවල බහින් බස් වීමක් ඇති කරගත් අතර, එහිදී ප්‍රියා පැවසුවේ "ඔබ බෙලහීනයි" යනුවෙනි. මෙය ඇසුණු වහාම කුමාර මේසය මත තිබූ පිහියක් ගෙන ප්‍රියාට අනින ලද අතර තුවාල හේතුවෙන් ඇය මිය ගියේය.

කුමාරට උපදෙස් දෙන්න.

(ලකුණු 100)